**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදල - 2014**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම

පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව වර්ෂය තුළ මුදල් ගලාගෙන ඒම් සහ ගලායෑම් පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කළයුතු නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුදල් ප්‍රවාහයක් නොවන දායක ගිණුම් සඳහා උපචිත කර ඇති රු.8,866,549 ක ලාභාංශ ගෙවීම් මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය, කල් පිරීම හා සේවක ණය නිකුත් කිරීම සඳහා වූ ගෙවීම් මුදල් ප්‍රවාහය හා ආපසු අයකර ගැනීම සම්බන්ධ මුදල් ඇතුළත් කළයුතු වුවත්, එසේ ලැබීම් හා යෙදවීම් වෙන් වෙන්ව දැක්වීම වෙනුවට ශුද්ධ මුදල් ප්‍රවාහය දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ක්‍රියාකාරකම්හි දක්වා ඇති දායක ගිණුම් තුළට වූ සත්‍ය මුදල් ප්‍රවාහය රු.19,125,108 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ රු.25,553,417ක් ලෙස දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුළ රු.115,122,702 ක් භාණ්ඩාගාර බිල්පත් තුළ ආයෝජනය කර තිබූ අතර, රු.101,461,634ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් කල් පිරී තිබුණි. කල් පිරුණු හා ආයෝජනය කළ බිල්පත් වලින් වර්ෂයට අදාළව රු.9,924,467 ක පොළී ආදායමක් හඳුනාගෙන තිබුණි. මෙම පොළී මත ගෙවූ රඳවා ගැනීම් බදු අඩු කිරීමක් සිදු වී නොතිබියදී බදු වශයෙන් රු.991,526 ක මුදලක් ගිණුම් ගත කර තිබුණි. මෙසේ අඩු කිරීමට හේතු වූ කිසිදු මූලාශ්‍ර ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

### 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ IV වන කොටසේ (2) ඡේදයෙහි අර්ථසාධක අරමුදල සඳහා පොදු ගිණුමක් හා එක් එක් දායකයා වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පවත්වා ගෙන යා යුතු වුවද අර්ථසාධක අරමුදලේ පොදු ලෙජරය තුළ සේව්‍ය සේවක ලෙස පොදු දායක ගිණුම් 2ක් හා උප ලෙජරය තුළ සේව්‍ය, සේවක ලෙස ගිණුම් 2ක් පවත්වා ගෙන ගොස් තිබුණි. මෙලෙස දායක ගිණුම් කොටස් 2කින් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය විගණනයට පැහැදිළි නොවුනු අතර, මෙවැනි වර්ගීකරණයක් තුළ මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්හට අර්ථසාධක අරමුදල තුළ සේව්‍යයාට හිමිකම් පවතින බවට වැරදි වැටහීමක් ඇතිවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,854,467ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය

සඳහා වූ අතිරික්තය රු.10,077,969 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු.223,502 ක් විය. මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී ආදායම රු.302,794 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සේවක අර්ථසාධක අරමුදල ස්ථිර සේවකයින්ගේ මාසික ඉපයීම් වලින් අයකරන සියයට 10ක දායක මුදල හා විශ්වවිද්‍යාලය මගින් එම ඉපයීම් මත ගෙවනු ලබන සියයට 15 ක දායක මුදලින් සමන්විත වේ. එම මුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම හා සේවක ණය ලබාදීමට කටයුතු කරනු ලබයි. අරමුදලේ දායක ගිණුම්වලට බැර කරන ලද පොළිය සමාලෝචිත වර්ෂයේ රු.8,866,549ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.9,065,820 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ පොළී ප්‍රමාණය සියයට 2.2 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෑම වර්ෂයක් අවසානයේම පාලක සභාව විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා පනතේ 28(3) වගන්තිය අනුව වැල් පොළී ප්‍රතිශතයක් නියම කළ යුතු වුවත්, ඒ සඳහා අදාළ අනුමැතීන් ලබා ගැනීමකින් තොරව වසරේ ලාභය පදනම් කරගනිමින් සියයට 8.11ක පොළියක් නියම කර රු.8,866,549ක් දායක ගිණුම් අතර බෙදා හැර තිබුණි.

(ආ) අර්ථසාධක අරමුදලක දායක ගිණුම් තුළ ඇති ශේෂයන් අදාළ දායකයාගේ හෝ උරුමක්කරුවන්ගේ ඉල්ලීමකින් තොරව වසා නොදමන අතර, අර්ථසාධක අරමුදලේ ශේෂය මත එය ඉවත් කරගන්නා තෙක් පොළී ගෙවිය යුතුය. එහෙත් විනය හේතු මත ආයතනයෙන් ඉවත් කර කම්කරු විනිශ්චය සභාවේ නඩු පවරා ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ ඉල්ලීමකින් තොරව සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් වසා දමා වසර ගණනාවක සිට එම ශේෂයන්ට පොළී ගණනය නොකොට ඔවුන්ට අදාල පොළිය අනෙකුත් ගිණුම් හිමියන්ට බැර වනසේ ගිණුම් ගත කර තිබුණි. (විස්තර පහත දැක්වේ)

| පොලී ගණනය කළයුතු ගිණුම් ශේෂය | අවසන්වරට පොලී බැරකර ඇති වර්ෂය | සේ.අ.අ.ඉල්ලුම් කර ඇති දිනය | පොලී ගණනය නොකළ වර්ෂ ගණන |
|---|---|---|---|
| (රු) | | | |
| 470,841 | 2004 | 2014.09.01 | 10 |
| 396,543 | 2008 | ඉල්ලුම් කර නැත | 6 |

(ඇ) අර්ථසාධක අරමුදලේ වර්ෂ අවසාන දායකය මත ලාභාංශ බෙදා හැරීම සාමාන්‍ය ක්‍රමය බැවින්,අරමුදලේ ගිණුම් හිමියන්ට ප්‍රවර්තන වර්ෂයේ දායකය වෙනුවෙන්ද ලාභාංශ හිමි වියයුතු වේ. එහෙත් 2014 වර්ෂය තුළ බඳවාගත් නව සාමාජිකයින් 23 දෙනෙකුගේ එකතුව රු.1,394,738ක් වූ දායක මුදල් වෙනුවෙන් කිසිදු ලාභාංශයක් ලබා දී නොතිබුණි. මෙලෙස ප්‍රවර්තන වර්ෂයේ දායකය වෙනුවෙන් දෙයාකාරයකට ලාභාංශ උපචිත කිරීමට හේතුවූ කරුණු විගණනයට පැහැදිළි නොවීය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

(අ) ආයෝජන හා ආයෝජන ආදායම් පාලනය

(ආ) ණය හා අත්තිකාරම් පාලනය

(ඇ) දායක ගිණුම් පාලනය